## මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

# 2018 අංක 35 දරන මුදල් පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම

# සමාගම් ලියාපදිංචි කිරීමේ අයබද්ද අයකිරීම

## (2020 මාර්තු 31 දක්වා දින දීර්ඝ කිරීම පිළිබඳ දැන්වීම)

2018 අංක 35 දරන මුදල් පනතේ IX වන කොටසින් වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අයබද්දක් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියා පදිංචි කරනු ලැබූ සෑම සමාගමකින්ම අයකරනු ලැබිය යුතු බව දන්වා ඇත .

| 1. සමාගම් කාණ්ඩය | ගෙවිය යුතු බද්ද ( වර්ෂයකට රුපියල්) |
|---|---|
| සීමාසහිත පුද්ගලික සමාගම් | රු. 30,000.00 |
| සීමාසහිත ලැයිස්තුගත පොදු සමාගම් | රු. 1,500,000.00 |
| වෙනත් සීමාසහිත සමාගම් (පොදු සමාගම්, විදේශීය සමාගම්) | රු. 250,000.00 |

**(ඉහත අය බද්ද අක්වෙරළ සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම්වලට අදාළ නොවේ.)**

2. 2016 ජනවාරි මස 01 වන දිනෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඉහත සඳහන් එක් එක් සමාගම් කාණ්ඩය සඳහා අයබද්ද ගෙවිය යුතුය.
3. ඉහත සඳහන් එක් එක් සමාගම් කාණ්ඩ සඳහා 2020 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර, අයබද්ද සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.
4. 2016 ජනවාරි මස 01 වන දිනට පෙර සංස්ථාගත කළ සෑම සමාගමක්ම අය බද්ද ගෙවිය යුතුය.
5. 2016 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ 2019 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ යම් සමාගමක් අයබද්ද ගෙවීමට යටත් නොවිය යුතුය.
6. ඉහත කාණ්ඩ යටතේ යම් සමාගමක් අයබද්ද ගෙවීම පැහැර හරී නම් මෙම පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සැලකේ.
7. යම් බදු පැහැර හරින්නකුට විරුද්ධව නඩු පැවරීම සහ එම අය බද්ද අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.
8. ඉහත සඳහන් එක් එක් කාණ්ඩ යටතේ දැනටමත් අයබද්ද ගෙවා ඇති සමාගම් මෙම බද්ද ගෙවිය යුතු නොවන අතර, අඩුවෙන් ගෙවා ඇති සමාගම් පමණක් හිඟ බදු මුදල ගෙවිය යුතුය.
9. ඉහත අයබදු සංශෝධනයන් 2018 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන බව දන්වා සිටිමි.

**ඞී.එන්.ආර්. සිරිවර්ධන, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,**
**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,**
**කොළඹ. 10.**
**2020-01-24 දින.**

දිනමිණ
The Dinamina
January 27, 2020